# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2358/47 - 2023 නොවැම්බර් මස 15 වැනි බදාදා - 2023.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීම (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම.

*ගොනු අංකය* : KEG/LAN/AQU/A3/01/116
*ඉඩම් අමාත්‍යාංශ අංකය* : 4-3/06/2018/එච්ඩබ්ලිව්/141

කෑගල්ල අතුරු මාර්ගයේ (3 වන අදියර) පදික වේදිකාව හා පැති කාණුව ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් ඉඩම් කැබැල්ල අත්කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර :

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාවත පත්තුව උතුර සුළු කොට්ඨාසයේ අංක 51 ඊ ගොලහැල ග්‍රාම නිලධාරී වසමේ - පිටිහුම (කොට්ඨාස අංක 08, කෑගල්ල නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද 2022.07.26 දිනැති හා මු.පි.කැ. 3851 දරන පිඹුරේ පහත උප ලේඛනයේ සඳහන් ඉඩම් කැබැල්ල:

01. කැබලි අංක 01

ඉඩමේ නම: හිටිනාවත්ත, වරිපනම් අංක 185, බණ්ඩාරනායක මාවත; හිමිකම් පාන්නන්ගේ නම සහ ලිපිනය: ජේ. ඒ. ආර්. ඩී. නිශා කුමාරි, අංක 1/191, බණ්ඩාරනායක මාවත, කෑගල්ල; ප්‍රමාණය: හෙක්. 0.0003.

උතුරට: කෑ 3448 වැනි මූලික පිඹුරේ කැබලි අංක 33; නැගෙනහිරට: කෑ 3448 වැනි මූලික පිඹුරේ කැබලි අංක 33 සහ ජේ. ඒ. ආර්. ඩී. නිශා කුමාරි හිමිකම් කියන හිටිනාවත්ත; දකුණට: ජේ. ඒ. ආර්. ඩී. නිශා කුමාරි හිමිකම් කියන හිටිනාවත්ත; බටහිරට: කෑ 3448 වැනි මූලික පිඹුරේ කැබලි අංක 33.

ඉහත සඳහන් ඉඩමට / පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.12.20 වැනි දින පෙරවරු 10.00 ට කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2023.12.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. ජී. එස්. නිශාන්ත
ප්‍රාදේශීය ලේකම්,
කෑගල්ල.

2023 නොවැම්බර් මස 10 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

EOG 11 - 0155

---

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම.

*ගොනු අංකය* : DIVNA/LAD/LA/ACQU I/4/1/22
*ඉඩම් අමාත්‍යාංශ අංකය* : 4-3/09/2020/HW//169

පොදු මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් රජයට අත්කර ගෙන ඇත. ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

අත්කර ගෙන ඇති ඉඩම්වල විස්තර :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1054, ගොඩාකුරුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගොඩාකුරුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් කුරුණෑගල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2023.01.20 දිනැතිව මැන සකස් කරන ලද අවසාන ගම් පිඹුරු අංක 2529 දරන පිඹුරේ කැබලි අංක 1 සිට 3 වශයෙන් දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1123ක් පමණ වූ පහත විස්තර කරන ඉඩම් කැබලි:

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: කොන්ගහමුලහේන වත්ත; ඉඩමේ පරිහරණය: වත්ත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: - ආර්. එම්. අනුලා කුමාරි; ප්‍රමාණය: හෙක්. 0.0075.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: දමුණුගහමුල වත්ත; ඉඩමේ පරිහරණය: වත්ත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: - එස්. ආර්. එම්. එස්. එස්. චන්ද්‍රකුමාර; ප්‍රමාණය: හෙක්. 0.0751.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: දමුණුගහමුල වත්ත; ඉඩමේ පරිහරණය: වත්ත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: කේ. ආර්. කරුණාරත්න; ප්‍රමාණය: හෙක්. 0.0299.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන්ගේ නම් ගැසට් පත්‍රයේ පළ වී ඇතත්, නැතත් එම ඉඩම් සම්බන්ධයෙන් තමන්ට ඇති අයිතිවාසිකම් එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම පිටපත් දෙකකින් යුත් ලියවිලි එම ඉඩම්වලට ඇති අයිතියේ ස්වභාවය හා එම ඉඩම් කැබලිවල අයිතිය වෙනුවෙන් තමන්ට ඉදිරිපත් කළ හැකි සාක්ෂි වන්දි මුදල හා එය ගණන් බැලූ ආකාරය පිළිබඳ විස්තරත් 2023 දෙසැම්බර් මස 27 දින පෙ. ව. 10.00ට නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

තවද 2023.12.20 වැනි සිට මා විසින් දැනුම් දෙනු ලබන දිනයකදී තමන් විසින්ම නැතහොත් ලිඛිතව බලය පවරන නියෝජිතයකු මගින් නියමිත දින නියමිත වේලාවට, අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනෙකුත් ලියවිලි සමග මා විසින් නියම කරනු ලබන ස්ථානයකදී පනතේ 9 වන වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතුය.

පරීක්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලය පවරන ලිපියක් නොමැතිව ඔහුගේ/ඇයගේ ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් කර ගනු නොලබන බව අවධාරණය කරමි.

එම්. ආර්. එම්. ඉම්රාන්,
ප්‍රාදේශීය ලේකම් (වැ. බ.),
නාරම්මල.

2023 නොවැම්බර් මස 08 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0156

---

## ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

යොමු අංකය: 2/2/1/CH/138

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක. 2002/64 හා 2017.01.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමේ 3ඒ පිටුවේ සඳහන් මූ. පි. ගම් 4017 හි කැබලි අංක 43 ලෙස සටහන් වන ඉඩම් කොටස මැනුම් සංශෝධන පරිදි ක.සි. 511850හි කලාප අංකය 01 පත්‍ර අංකය 01හි කැබලි අංක 1 සහ 2 ලෙස විභජනය වී ඇති අතර කැබලි අංක. 1 හා 2 ට අදාළ ඡේද පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක. 1**
ඉඩමේ නම: නුගගහලන්ද; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්. ඒ. සුජීවා වනසිංහ, අංක 181/බී/3, කොස්සින්න, ගණේමුල්ල (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා) ; ප්‍රමාණය: හෙක්. 0.0026.

02. **කැබලි අංක. 2**

ඉඩමේ නම: නුගගහලන්ද; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්. ඒ. සුජීවා වනසිංහ, අංක 181/බී/3, කොස්සින්න, ගණේමුල්ල (අවසතු කිරීම සඳහා) ; ප්‍රමාණය: හෙක්. 0.0039.

කේ. ඒ. එස්. එල්. ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම්,
ගම්පහ.

2023.11.09
ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

EOG 11 - 0157

---

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි**
**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**ශුද්ධි පත්‍රිකාව**

යොමු අංකය: 3/2/3/10/257(1)-739

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක. 1986/59 හා 2016.09.30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 2ජ් පිටුවේ සඳහන් මූ. පි. ගම් 4005 හි කැබලි අංක. 24 ලෙස සටහන් වන ඉඩම් කොටස මැනුම් සංශෝධන පරිදි මූ. පි. ගම් 4264 හි කැබලි අංක. 1 සහ 2 ලෙස විභජනය වී ඇති අතර කැබලි අංක. 1 හා 2 ට අදාළ ඡේද පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක. 1**

ඉඩමේ නම: හල්වලවත්ත නොහොත් හල්ගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවුරුදු 15 - 20 පමණ වයසැති පොල් ගස් 1ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ආර්. එම්. ඒ. පී. වනතුංග, අංක. 15/1සී, හල්වලවත්ත, කඳඹළුවාව, (මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වී ඇත); ප්‍රමාණය: හෙක්. 0.0265.

02. **කැබලි අංක. 2**

ඉඩමේ නම: හල්වලවත්ත නොහොත් හල්ගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටස් 2ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ආර්. එම්. ඒ. පී. වනතුංග, අංක. 15/1සී, හල්වලවත්ත, කඳඹළුවාව, (අවසතු කිරීම සඳහා); ප්‍රමාණය හෙක්. 0.0180.

එස්. පී. ගුණවර්ධන
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල.

2023.11.09
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

EOG 11 - 0158

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.